සැ.යු .- 2016.05.06 වැනි දින පළ වූ අංක 1966 දරන *ගැසට් පත්‍රයේ* III හා IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,967 - 2016 මැයි මස 13 වැනි සිකුරාදා - 2016.05.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 350 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 358 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 359 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


සැ.යු .- බී. වයි. තුඩාවේ සමාජ සත්කාරක පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 මාර්තු මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 ජුනි මස 03 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 මැයි මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


349 – B 081056 —403 (2016/05)

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2016 අංක 273

MOD/DEF/2/01/ENL/09//UNI.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම්

පහත සඳහන් කෙඩෙට් නිලධාරි 2014.05.01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ දෙවන ලුතිනන් නිලයෙන් අධිකාරියට පත්කිරීම සහ එදිනම සිට බලපැවැත්වෙනසේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට, අතිගරු ජනාධිපතිතුමන් විසින් ප්‍රසාදය පළකරනු ලැබ තිබේ.

අ. සී/58183 කෙඩෙට් නිලධාරි පියත් රන්දුල අලවත්ත

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹ දී ය.

05 - 168

---

2016 අංක 274

MOD/DEF/2/01/ENL/09/UNI.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම්

පහත සඳහන් කෙඩෙට් නිලධාරි 2015.02.09 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ දෙවන ලුතිනන් නිලයෙන් අධිකාරියට පත්කිරීම සහ එදිනම සිට බලපැවැත්වෙනසේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට, අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පළකරනු ලැබ තිබේ.

අ. සී/58189 කෙඩෙට් නිලධාරි නාගොඩගේ තරිඳු සම්පත් පෙරේරා

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹ දී ය.

05 - 206

2016 අංක 275

MOD/DEF/2/01/ENL/09//UNI.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම්

පහත සඳහන් කෙඩෙට් නිලධාරි 2015.03.18 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ දෙවන ලුතිනන් නිලයෙන් අධිකාරියට පත්කිරීම සහ එදිනම සිට බලපැවැත්වෙනසේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට, අතිගරු ජනාධිපතිතුමන් විසින් ප්‍රසාදය පළකරනු ලැබ තිබේ.

අ. සී/57241 කෙඩෙට් නිලධාරි ප්‍රූඩ් රුක්ෂාන් නෙයුමාල් වික්‍රමතිලක

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹ දී ය.

05 - 167

---

2016 අංක 276

MOD/DEF/2/01/ENL/02/LCDT.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම්

පහත නම් සඳහන් කාන්තා කෙඩෙට් නිලධාරීන් 2015.06.27 වැනි දින සිට දක්වා ඇති ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙළ අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ දෙවනි ලුතිනන් නිලයෙන් අධිකාරියට පත්කරනු ලැබීම සහ එදින සිට නමට ඉදිරියෙන් දක්වා ඇති රෙජිමේන්තු/බළකා වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට අතිගරු ජනාධිපතිතුමන් විසින් ප්‍රසාදය පළකරනු ලැබ තිබේ.

සී/59475 කාන්තා කෙඩෙට් නිලධාරි වේරගොඩ ගමගේ දෝන නදීශා සඳුනි වේරගොඩ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකාය

සී/59484 කාන්තා කෙඩෙට් නිලධාරී රාජසිංහ මුදියන්සේලාගේ අජිත්ගේ ෂානිකා පුෂ්පකුමාරි රාජසිංහ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බළකාය

සී/59483 කාන්තා කෙඩෙට් නිලධාරී හොරදුගොඩ ගල්හේනගේ ජමිලා භවන්ති ගල්හේනගේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකාය

සී/59472 කාන්තා කෙඩෙට් නිලධාරී ඩිල්ෂානි පාටලී එදිරිවීර, ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකාය

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹ දී ය.

05 - 205

---

2016 අංක 277

MOD/DEF/07/01/AVF/RET/740.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බළසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරි 2015 ජූලි මස 10 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කර්නල් පලිහේනගේ ලක්ෂ්මන් තිසේරා (නි/2524)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 ඔක්තෝබර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

05 - 420

2016 අංක 278

MOD/DEF/07/01/AVF/RET/739.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බළසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2016 පෙබරවාරි මස 02 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් කර්නල් වලිසුන්දර මුදියන්සේලාගේ සුනිල් නවරත්න බණ්ඩාර ශ්‍රීලකාභ(නි/2525)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 ඔක්තෝබර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

05 - 422

---

2016 අංක 279

MOD/DEF/07/01/AVF/RET/714.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බළසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරිණී 2015 ඔක්තෝබර් මස 08 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් මල්ලවආරච්චිගේ අමිලා තුෂාරි මල්ලවආරච්චි, ශ්‍රීලයුකාබ (නි/5545)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 ජූලි මස 30 වැනි දින,
කොළඹ දී ය.

05 - 421

2016 අංක 280

MOD/DEF/07/01/AVF/RET/742.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බළසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2016 ජනවාරි මස 17 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් (උපකරණ පාලක - පොදු රාජකාරි) කපුවගේ සමන්සිරි විජේතුංග, ශ්‍රීලංජාආබමු (නි/8500)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 ඔක්තෝබර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

05 - 423

---

2016 අංක 281

MOD/DEF/07/01/AVF/RET/696.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බළසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2015 මාර්තු මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් (උපකරණ පාලක - පොදු රාජකාරි) මුණසිංහ ආරච්චිගේ උපාලි ඉන්ද්‍රරත්න, ශ්‍රීලංසිරෙ (නි/9490)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 මැයි මස 18 වැනි දින,
කොළඹ දී ය.

05 - 418

2016 අංක 282

MOD/DEF/07/01/AVF/RET/732.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බළසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2016 පෙබරවාරි මස 28 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් (උපකරණ පාලක - පොදු රාජකාරි) හල්පේ දහනක රාලලාගේ ජනිත් දිසානායක, ශ්‍රීලංසිරෙ (නි/9480)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 ඔක්තෝබර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

05 - 425

---

2016 අංක 283

MOD/DEF/AVF/07/01//RET/693.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බළසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2015 ජූලි මස 15 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් වර්ණකුලසූරියගේ සුජිත් සාන්ත, ශ්‍රීලංජාආබමු (නි/7541)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 මැයි මස 18 වැනි දින,
කොළඹ දී ය.

05 - 424

2016 අංක 284

DIVF/RECT/56/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බළසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
අධිකාරියට පත්කිරීම් හා ඇතුළත් කිරීම්

**අධිකාරියට පත්කිරීම් හා ඇතුළත් කිරීම්**

පහත නම සඳහන් කෙඩෙට් නිලධාරී 2012 දෙසැම්බර් මස 22 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ දෙවන ලුතිනන් නිලයෙන් අධිකාරියට පත්කිරීම හා එදිනම සිට ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුව වෙත ඇතුළත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරනු ලැබ ඇත.

කෙඩෙට් නිලධාරි මනන්නලාගේ බුද්ධික චතුරංග ජයරත්න

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 නොවැම්බර් මස 14 වැනි දින,
කොළඹ දී ය.

05 - 374

---

2016 අංක 285

MOD/DEF/07/01/AVF/RET/706.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බළසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරි 2015 මැයි මස 07 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

දෙවන ලුතිනන් විජේන්ද්‍ර වඩුගේ සරත් කුමාර ගරෙ (නි/7657)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 ජූලි මස 15 වැනි දින,
කොළඹ දී ය.

05 - 419

---

2016 අංක 286

MOD/DEF/07/01/AVF/RET/729.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බළසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2015 සැප්තැම්බර් මස 30 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

දෙවන ලුතිනන් දලුමුරකර ගෙදර අජිත් ඉන්දික උදය කුමාර, ගැහේබ (නි/7482)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 ඔක්තෝබර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

05 - 417

---

2016 අංක 287

MOD/DEF/03/02/RET/147.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2014 දෙසැම්බර් මස 16 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායෙන් විශ්‍රාම ගන්වා ඇත.

රියර් අද්මිරාල් (සැ) කුරුකුලසූරිය ජෝශප් කොන්රඩ් ෂේමාල් ප්‍රනාන්දු, ආර්එස්පී, යූඑස්පී, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එස් 0170

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 සැප්තැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

05 - 368

2016 අංක 288

MOD/DEF/03/02/PRO/RNF/04/02.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2014 නොවැම්බර් මස 17 වැනි දින සිට තාවකාලික රියර් අද්මිරාල් වශයෙන් ඃ*

කොමදෝරු නන් අදිකාරිලාගේ නිමල් සරත්සේන, ආර්එස්පී* ශ්‍රීලංනාහ-එන්ආර්එක්ස් 0238

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 පෙබරවාරි මස 13 වැනි දින,
කොළඹ දී ය.

05 - 364

---

2016 අංක 289

D/22/NY/468.

**ශ්‍රී ලංකා නාවික හමුදාව**

නිත්‍ය නාවික උපසේවයට මාරු කිරීම

පහත නම සඳහන් නිලධාරියා 2012 ජනවාරි මස 10 වැනි දින සිට නිත්‍ය නාවික උපසේවයට මාරුකිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

කොමදෝරු (විශ්‍රාමික) ගීකියනගේ එඩ්වඩ් ක්‍රිස්ටි ජයවර්ධන, ආර්එස්පී, යූඑස්පී, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0177

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 මාර්තු මස 16 වැනි දින,
කොළඹ දී ය.

05 - 372

---

2016 අංක 290

MOD/DEF/03/02/PRO/RNF/02/01.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද ස්ථිර කිරීම්

*2014 ජනවාරි මස 01 දින සිට කපිතාන් වශයෙන්ඃ*

කොමාණ්ඩර් (ඉ) [තාවකාලික කපිතාන් (ඉ)] කදවින්න මුදියන්සේලාගේ වසන්ත කුමාර කදවින්න, ආර්එස්පී, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්ඊ 0647

වෛද්‍ය කොමාණ්ඩර් [තාවකාලික වෛද්‍ය කපිතාන්] මානික බදුගේ ප්‍රභාත් චින්තක විජේදාස, ශ්‍රීලංනාහ - එන්ආර්එම් 0851

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 පෙබරවාරි මස 07 වැනි දින,
කොළඹ දී ය.

05 - 370/2

---

2016 අංක 291

D/RF/824/NY/3/3.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2009 ජනවාරි මස 01 වැනි දින සිට තාවකාලික කපිතාන් වශයෙන් ඃ*

කොමාණ්ඩර් (සංඥා) ඉනිසි රංජිත් ප්‍රේමරත්න, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0451

කොමාණ්ඩර් (සංඥා) වේවැල්වල හේවගේ උපුල් අබේරත්න, යූඑස්පී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0361

කොමාණ්ඩර් (සැ) සම්පත් නිශාන්ත කුමාර පත්බේරිය, ශ්‍රීලංනාහ - එන්ආර්එස් 0358

කොමාණ්ඩර් (ටැස්) දවටගේ අතුල සිරිමෙවන් පොතුපිටිය, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0519

කොමාණ්ඩර් (සැ) මාලැබගේ තිලක් සිගේරා, ආර්එස්පී, ශ්‍රීලංනාහ - එන්ආර්එස් 0401

කොමාණ්ඩර් (ඉ) හුලංගස්දළුවේ උපුල් කිත්සිරි කුමාරසේන, ශ්‍රීලංනාහ - එන්ආර්ඊ 0475

කොමාණ්ඩර් (තුවා) පනාවලවිදානලාගේ ජූඩ් ප්‍රැන්සිස් පීරිස්, ශ්‍රීලංනාහ - එන්ආර්බී 0547

කොමාණ්ඩර් (එන්ඩී) මාරසිංහ මුදියන්සේලාගේ අතුල රොහාන් සෙනරත්, ආර්එස්පී, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0406

කොමාණ්ඩර් (එන්ඩී) කරුණානායකගේ ජයන්ත කුලරත්න, ආර්එස්පී, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0397

කොමාණ්ඩර් (කිමි) හොරගම්පිට ජයන්ත අමරදාස ගමගේ, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0507

කොමාණ්ඩර් (ඒඑස්ඩබ්) ලේල්වල හේවගේ සුදත් රෝහණ ලේල්වල, ආර්ඩබ්පී, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0527

කොමාණ්ඩර් (සිඉ) සින්නදුරෙයි හගවාන් විවේහනාත්තන්, ශ්‍රීලංනාහ - එන්ආර්සී 0756

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 සැප්තැම්බර් මස 16 වැනි දින,
කොළඹ දී ය.

05 - 363

---

2016 අංක 292

MOD/DEF/03/02/PRO/RNF/02/01.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද ස්ථිර කිරීමක්

*2013 ජනවාරි මස 01 වැනි දින සිට කොමාණ්ඩර් (සැ) වශයෙන්:*

ලුතිනන් කොමාණ්ඩර් (සැ) [තාවකාලික කොමාණ්ඩර් (සැ)] වෙදගෙදර සෙනරත් කීර්ති කුමාර රත්නායක, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එස් 1191

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 ජූලි මස 17 වැනි දින,
කොළඹ දී ය.

05 - 370/1

---

2016 අංක 293

MOD/DEF/03/02/RET/154.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2015 මාර්තු මස 31 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායෙන් විශ්‍රාම ගන්වා ඇත.

කොමාණ්ඩර් (සැ) කළුවාහත් ජානක පුෂ්පකුමාර, ශ්‍රීලංනාහ - එන්ආර්එස් 0831

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2014 පෙබරවාරි මස 26 වැනි දින,
කොළඹ දී ය.

05 - 369

---

2016 අංක 294

D/22/NY/450.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන්
ඉල්ලා අස්වීමක්

2009 පෙබරවාරි මස 10 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා නාවික හමුදා ස්ථිර බලකායේ පහත නම සඳහන් නිලධාරියාගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිනන්-කොමාණ්ඩර් (සැ) හරක්ගම ගෙදර රත්නසේන, එන්ආර්එස් 1193, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2009 මාර්තු මස 17 වැනි දින,
කොළඹ දී ය.

05 - 373

2016 අංක 295

MOD/DEF/03/02/PRO/RNF/01/07.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිලයේ ස්ථිර කිරීම්

*2014 සැප්තැම්බර් මස 12 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (අවි) වශයෙන්:*

ලුතිනන් (අවි) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (අවි)] ගෝදාව පතිරණගේ ඉන්දික එරංග, එන්ආර්එක්ස් 1662, ශ්‍රීලංනාහ

*2016 මාර්තු මස 01 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (වි) වශයෙන්:*

ලුතිනන් (වි) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (වි)] නිලෝචන සම්පත් වික්‍රමසිංහ, එන්ආර්එල් 2290, ශ්‍රීලංනාහ

*2016 මාර්තු මස 01 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන්:*

ලුතිනන් (ඉ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ)] කුරුකුලආරච්චිගේ අසංග කුරුකුලආරච්චි, එන්ආර්ඊ 2291, ශ්‍රීලංනාහ

ලුතිනන් (ඉ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ)] උඩුවර මිරෙස්ඤඥගේ සිසිත ගයාන් සිල්වා, එන්ආර්ඊ 2297, ශ්‍රීලංනාහ

ලුතිනන් (ඉ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ)] කසුන් චමේන්ද්‍ර ධනපාල, එන්ආර්ඊ 2298, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 අප්‍රේල් මස 22 වැනි දින,
කොළඹ දී ය.

05 - 371

---

2016 අංක 296

MOD/DEF/03/02/RET/142.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් නිලධාරිණිය 2014 ඔක්තෝබර් මස 11 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිනන් කොමාණ්ඩර් (වි) මුතුතන්ත්‍රිගේ අයෝමා බුද්ධිණී චන්ද්‍රවන්ස කුරේ, එන්ආර්එල් 1411, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 ජූලි මස 24 වැනි දින,
කොළඹ දී ය.

05 - 367

---

2016 අංක 297

MOD/DEF/03/02/PRO/RNF/01/07.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිලයේ ස්ථිර කිරීම්

*2016 පෙබරවාරි මස 14 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (වි) වශයෙන්:*

ලුතිනන් (වි) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (වි)] කටුනායකගේ අමිල චින්තක පෙරේරා, එන්ආර්එල් 1825, ශ්‍රීලංනාහ.

*2016 පෙබරවාරි මස 16 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන්:*

ලුතිනන් (ඉ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ)] සමරනායක මුදියන්සේලාගේ ජිනදාස වදන්ත අරුණෝද සමරනායක, එන්ආර්ඊ 2293, ශ්‍රීලංනාහ.

*2016 පෙබරවාරි මස 16 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (සිඉ) වශයෙන්:*

ලුතිනන් (සිඉ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සිඉ)] ඉන්දීප ගිහාන් පණ්ඩිතරත්න, එන්ආර්සී 2304, ශ්‍රීලංනාහ.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹ දී ය.

05 - 208/1

---

2016 අංක 298

MOD/DEF/03/02/PRO/RNF/01/07.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිලයේ ස්ථිර කිරීම්

*2016 පෙබරවාරි මස 21 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (මාලිමා) වශයෙන්:*

ලුතිනන් (මාලිමා) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (මාලිමා)] කංකානමලාගේ එරංග බුද්ධික, එන්ආර්එක්ස් 1885, ශ්‍රීලංනාහ.

*2016 පෙබරවාරි මස 23 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (වි) වශයෙන්:*

ලුතිනන් (වි) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (වි)] කුලරත්නගේ ඉසුරු මලින්ද කුලරත්න, එන්ආර්එල් 2294, ශ්‍රීලංනාහ.

*2016 පෙබරවාරි මස 23 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (සිඉ) වශයෙන්:*

ලුතිනන් (සිඉ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සිඉ)] තේනාරත්නගේ දිනේෂ් නිශාන්ත, එන්ආර්සී 2295, ශ්‍රීලංනාහ.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹ දී ය.

05 - 208/2

---

2016 අංක 299

MOD/DEF/03/02/PRO/RNF/01/03.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2012 දෙසැම්බර් මස 28 වැනි දින සිට තාවකාලික ලුතිනන්-කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් රෝෂාන් හෙට්ටිආරච්චි, එන්ආර්එක්ස් 1749, ශ්‍රීලංනාහ

*2013 ජනවාරි මස 11 වැනි දින සිට තාවකාලික ලුතිනන්-කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් බියගමගේ දිමුතු සමීර තිසේරා, එන්ආර්එක්ස් 2222, ශ්‍රීලංනාහ

*2013 අප්‍රේල් මස 02 වැනි දින සිට තාවකාලික ලුතිනන්-කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් නයිදූවා වඩු ඩෙවෝන් කෝසල, එන්ආර්එක්ස් 1772, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී. ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන, අමාත්‍යාංශය.

2013 මැයි මස 09 වැනි දින,
කොළඹ දී ය.

05 - 366

---

2016 අංක 300

MOD/DEF/03/02/PRO/RNF/01/07.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2016 පෙබරවාරි මස 24 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන්:*

ලුතිනන් (ඉ) කරුණාරත්න මුදියන්සෙලාගේ මාධව උපේක බණ්ඩාර දයාරත්න, එන්ආර්ඊ 2319, ශ්‍රීලංනාහ.
ලුතිනන් (ඉ) දිවිතුරේ ගමගේ චාමර ජයරුවන්, එන්ආර්ඊ 2421, ශ්‍රීලංනාහ.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹ දී ය.

05 - 208/3

---

2016 අංක 301

MOD/DEF/03/02/PRO/RNF/01/07.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2016 මාර්තු මස 06 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (වි) වශයෙන්:*

ලුතිනන් (වි) මද්දුමාගේ ශිරන්ත කුමාර ප්‍රනාන්දු, එන්ආර්එල් 2462, ශ්‍රීලංනාහ.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹ දී ය.

05 - 208/4

2016 අංක 302

MOD/DEF/03/02/PRO/RNF/01/07.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2016 මාර්තු මස 27 වැනි දින සිට තාවකාලික ලුතිනන්-කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් වටගොඩ ගෙදර අසංත චන්ද්‍රපාල වටගොඩ, එන්ආර්එක්ස් 2349, ශ්‍රීලංනාහ
ලුතිනන් සිංහපුර ගෙදර ඉසුරු සංජීව පින්නවල, එන්ආර්එක්ස් 2361, ශ්‍රීලංනාහ
ලුතිනන් විජේසිංහ දේවයාලාගේ දිනේෂ් රවීන්ද්‍රලාල් විජේසිංහ, එන්ආර්එක්ස් 2365, ශ්‍රීලංනාහ

*2016 මාර්තු මස 27 වැනි දින සිට තාවකාලික ලුතිනන්-කොමාණ්ඩර් (සැ) වශයෙන් :*

ලුතිනන් (සැ) ලක්ෂිත දිල්රුක් සේරසිංහ, එන්ආර්එස් 2383, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 අප්‍රේල් මස 22 වැනි දින,
කොළඹ දී ය.

05 - 365

2016 අංක 303

MOD/DEF/03/02/RES/292.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක් සහ නිත්‍ය නාවික උප සේවයට මාරු කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා 2016 අගෝස්තු මස 31 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායෙන් විශ්‍රාම ගැන්වීම සහ එදින සිට නිත්‍ය නාවික උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිනන් විල්ලර ආරච්චිගේ සුමන ශ්‍රී ආනන්ද විජේදාස, එන්ආර්එක්ස් 2400, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹ දී ය.

05 - 207

# රජයේ නිවේදන

**රජයේ දැන්වීමයි**

1952 තිස්සමහාරාම වන්දනා රෙගුලාසි

1952 තිස්සමහාරාම වන්දනා රෙගුලාසි ප්‍රකාරව තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම්, ඩී. එල්. කේ. ප්‍රියවංශ වන මම පහත සඳහන් කාලය තිස්සමහාරාම වන්දනා රෙගුලාසි බල පවත්වන කාලය වශයෙන් නියම කරමි.

2016 වර්ෂයේ පොසොන් උත්සවය 2016 ජුනි මස 16 වැනි දින සිට 2016 ජුනි මස 22 වැනි දින දක්වා වේ. (2016 ජුනි මස 16 වැනි දින සහ ජුනි 22 වැනි දින ද ඇතුළත් වේ.)

ඩී. එල්. කේ. ප්‍රියවංශ,
ප්‍රාදේශීය ලේකම්,
තිස්සමහාරාම.

05 - 161

**බදුල්ල මුතියංගණ රජ මහා විහාරස්ථානයේ වාර්ෂික පෙරහැර**

362 අධිකාරය වූ වන්දනා ගමන් ආඥාපනතේ පළකර ඇති 1948 සැප්තැම්බර් මස 10 දාතම අංක 9902 *ගැසට් පත්‍රයේ* ද, 1951 අගෝස්තු මස 17 දාතම අංක 10283 *ගැසට් පත්‍රයේ* ද, 1955 මාර්තු මස 25 දාතම අංක 14778 *ගැසට් පත්‍රයේ* ද, 1992 අංක 58 බලතල පැවරීම (ප්‍රාදේශීය ලේකම්වරු) පනත අනුව 2011.06.10 වැනි දින අංක 1710 දරන *ගැසට් පත්‍රයේ* ද පළවූ බදුල්ල මුතියංගණ රජ මහා විහාරස්ථානයේ (වාර්ෂික පෙරහැර) පිළිබඳ ව්‍යවස්ථා අනුව ද බදුල්ල ප්‍රාදේශීය ලේකම් පී. එස්. පී. අබේවර්ධන වන මා වෙත පැවරී ඇති බලතල අනුව 2016 වර්ෂයේ බදුල්ල මුතියංගණ රජමහා විහාරස්ථානයේ පෙරහැර සම්බන්ධයෙන් පහත නියෝග පනවමි.

1. 2016 මැයි මස 21 සහ 22 යන දෙදින තුළ පෙරහැර වීදි සංචාරය කිරීමෙන් මුතියංගන විහාරස්ථානයට ගෙවදීමෙන් පසු පෙරහැර අවසන් වන බව දැනුම් දෙමි.

2. පෙරහැරේ ගමන් මාර්ගය :

2016 වෙසක් මස 21 වැනි දින මුතියංගණ විහාරස්ථානයෙන් පිටත් වී දුම්රියපොළ පාර, අනගාරික ධර්මපාල මාවත, පහළ වීදිය, රජ වීදිය, පුස්තකාල මාවතින් පහළ විදියට පැමිණ මුතියංගන විහාරස්ථානයට ගෙවැදීම.

2016 වෙසක් මස 22 මුතියංගණ විහාරස්ථානයෙන් පිටත් වී දුම්රියපොළ පාර, අනගාරික ධර්මපාල මාවත, කොකෝවත්ත පාර, උදයරාජ මාවත, රජ වීදිය, බසාර් වීදියෙන් පහළ වීදියට පැමිණ මුතියංගණ විහාරස්ථානයට ගෙවැදීම.

3. බදුල්ල මුතියංගණ විහාරස්ථානය පිහිටි භූමිය යන ස්ථානයන් හා ඒ අවට භූමි භාගවල ආහාර පිසීම හා වෙළඳාම් කිරීම තහනම් කරමි.

4. පෙරහැර කාලය තුළදී ප්‍රධාන මාර්ගවල පෞද්ගලික වාහන නතර කිරීම තහනම් කරමි. බයිසිකල් හා කරත්ත ඇතුළුව සියලුම රථ වාහන මගෙන් හෝ මුතියංගණ භාරකාර විහාරාධිපති ස්වාමීන් වහන්සේගේ බලපත්‍රයක් නොමැතිව විහාරස්ථාන භූමියට ඇතුළු කිරීම තහනම් කරමි.

5. පෙරහැර ගමන් ගන්නා මාර්ගයන්හි බදුල්ල මහ නගර සභාව මගින් විධිමත් අනුමැතියකින් ඉදිකරනු ලබන ගොඩනැගිලි හා දැනට ඇති ස්ථිර ගොඩනැගිලි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ උපදෙස්වලට අනුකූල විය යුතු ය. බිම් කොටස් බදු ගන්නා වෙළඳුන් විසින් විහාරස්ථාන පෙරහැරින් පසු තමාගේ තාවකාලික ගොඩනැගිලි ඉවත්කර ගැනීමෙන් පසු පෙරහැර ගමන් ගන්නා මාර්ගය හා විහාරස්ථාන භූමිය තුළ පොලිතින් ඇතුළු සියලුම අපද්‍රව්‍ය එකතුකර මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන්ගේ උපදෙස් පරිදි ඉවත් කළ යුතු ය.

6. මාගෙන් ලබාගත් අවසර පත්‍රයක් නොමැතිව පූජා භූමිය හා එහි අවට කිසිම තාවකාලික හෝ ගොඩනැගිල්ලක් ඉදිකිරීම තහනම් කරමි.

7. කිසිවකු විසින් මාගේ හෝ බදුල්ල මහ නගර සභාව මගින් අවසර ලබාගෙන මිස වීදියක් වශයෙන් පාවිච්චි කරන්නාවූ හෝ වෙන් කර තබන්නා වූ හෝ යම් බිමක් හෝ පූජා භූමි ප්‍රදේශයක් තුළ යම් බිමක් ඇසුරු කරගෙන මඩුවක් හෝ යම්කිසි අන්දමක ගොඩනැගිල්ලක් ඉදිකිරීම හෝ විශාල කිරීම නොකළ යුතුය.

8. රතිඤ්ඤා වෙඩි ආදිය ප්‍රදේශය තුළ පත්තු කිරීම තහනම්ය.

9. ප්‍රාදේශීය ලේකම්ගේ බලයලත් නිලධාරියකුගේ අනුමැතිය නොමැතිව කිසියම් තැනැත්තෙකු විසින් අංක 03හි දැක්වෙන කඳවුර ප්‍රදේශය තුළ ටිකට්පත්, කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යයන් සඳහා හෝ දායක මුදල් එකතු කිරීම නොකළ යුතුය.

පී. එස්. පී. අබේවර්ධන,
ප්‍රාදේශීය ලේකම්,
බදුල්ල.

2016 අප්‍රේල් මස 29 වැනි දින,
බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 - 433

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

පීවී 75816.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "බිග් ෂන්ෂයින් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2010.12.06 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "බිග් ෂන්ෂයින් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "බිග් ෂන්ෂයින් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,

2016 අප්‍රේල් මස 08 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

05 - 221

---

**නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ (සංශෝධිත) 4 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගැනුණු යෝජනාව

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2016ක් වූ මාර්තු මස 15 වැනි දින පැවැත්වූ රැස්වීමකදී පහත සඳහන් වන අයුරු විශේෂයෙන් හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (බැංකුව) නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් බී. එච්. එන්. අයි. සෙනවිරත්න මහත්මිය විසින් සහතික කරන ලද වර්ෂ 2014.11.26 දිනැති අංක 468 දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සිය ලියාපදිංචි කාර්යාලය මාවතගම පිහිටි 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි ලියාපදිංචි කරන ලද සමාගමක් වන එකෝ ඇපරල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම (ණයට ගන්නා) විසින් පැහැර ඇති හෙයින් ද,

තවද මොරටුව, කටුබැද්දේ පදිංචි දිලීප නන්ද වීරසිංහ යන අය විසින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය සඳහා වන සිය නිදහස් අයිතිවාසිකම් හිමිකම් සහ බලපුළුවන්කාරකම් එකී අංක 468 දරන උකස් බැඳුම්කරය යටතේ බැංකුවට උකස් කර ඇති හෙයින් ද,

තව ද වර්ෂ 2016ක් වූ පෙබරවාරි මස 29 වැනි දිනට එකී බැඳුම්කරය යටතේ බැංකුවට ඇමරිකානු ඩොලර් එක් ලක්ෂ හැට එක් දහස් තුන්සිය අටයි ශත හැට තුන (USD 1,61,308.63) ක මුදලක් අයවිය යුතුව හා ණයව පවතින බැවින්ද, (එකී ඇමරිකානු ඩොලර් එක් ලක්ෂ හැට එක්දහස් තුන්සිය අටයි ශත හැට තුන (USD 1,,61,308.63)හි 2016 පෙබරවාරි මස 29 වැනි දින වන විට රුපියල් වටිනාකම රුපියල් විසි තුන් මිලියන තුන් ලක්ෂ නව දහස් අනූ හතයි ශත හතර (රු. 2,33,09,097.04)ක් වේ.

සංශෝධනය කරන ලද 1990 අංක 4 දරන බැංකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත (ප්‍රධාන පනත) යටතේ බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරා ඇති බලතලවලට අනුව එකී ඇමරිකානු ඩොලර් එක් ලක්ෂ හැට එක්දහස් තුන්සිය අටයි ශත හැට තුන (USD 1,,61,308.63) (එකී ඇමරිකානු ඩොලර් එක් ලක්ෂ හැට එක්දහස් තුන්සිය අටයි ශත හැට තුන (USD 1,,61,308.63) හි 2016 පෙබරවාරි මස 29 වැනි දින වන විට රුපියල් වටිනාකම රුපියල් විසි තුන් මිලියන තුන් ලක්ෂ නව දහස් අනූ හතයි ශත හතර (රු. 2,33,09,097.04)ක මුදල සහ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද, වර්ෂ 2016 මාර්තු මස 01 වැනි දින සිට විකිණීම කරන දින දක්වා එකී අංක 468 දරන බැඳුම්කරය යටතේ බැංකුවට හිඟව පවතින මුදල වන ඇමරිකානු ඩොලර් එක් ලක්ෂ හැට දහස (USD 1,60,000.00) (එකී ඇමරිකානු ඩොලර් එක් ලක්ෂ හැට දහස (USD 1,,60,000.00)හි 2016 පෙබරවාරි මස 29 වැනි දින වන විට රුපියල් වටිනාකම රුපියල් විසි තුන් මිලියන එක් ලක්ෂ විසි දහස (රු. 2,31,20,000.00) ක මුදල මත වසරකට LIBOR + 4%ක පොළිය ද, ප්‍රචාරය හා විකිණීම සඳහා දරන්නට වන වියදම්ද ප්‍රධාන පනතේ 4 වැනි වගන්තියට අනුව දරා ඇති වෙනත් වියදම් ද මෙතැන් සිට ලබා ගන්නා කිසියම් ගෙවීමක් (එවැන්නක් ඇත්නම්)

ඇත්නම් එය ද අඩුකර ආපසු අයකර ගැනීම පිණිස එකී අංක 468 දරන බැඳුම්කරය යටතේ බැංකුවට උකස් කර ඇති මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට ප්‍රධාන පනතේ ඔවුන් වෙත පවරා ඇති බලතලවලට අනුව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

1. මොරටුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ සහ මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ (ගල්කිස්ස ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ වූ) සල්පිටි කෝරළේ, පල්ලේපත්තුවේ, මොරටුව නගර සභා සීමාව තුළ වූ , කටුබැද්ද ගමෙහි පිහිටි මිහිරි පෙදෙස, වරිපනම් අංක 05 දරන එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් ද ඇතුළත් ලේඩි කැතරින් ගෘෘප් යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙහි බලයලත් මානක ඩබ්ලිව්. ඒ. එන්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1999.06.16 දිනැති අංක 152 දරන පිඹුරෙහි ලොට් A ලෙස ලකුණු කර ඇති බෙදා වෙන් කළ ඉඩම් කොටස වන අතර එකී ලොට් A ඉහත කී අංක 152 දරන පිඹුර ප්‍රකාරට උතුරට : මිහිරි පෙදෙසේ වරිපනම් අංක 3 දරන පරිශ්‍රයෙන් ද, නැගෙනහිරට : සෝබන පෙදෙසේ වරිපනම් අංක 6 දරන පරිශ්‍රයෙන් ද, දකුණට : ලොට් B වලින් ද, බටහිරට : මිහිර පෙදෙසින් ද මායිම් වන අතර ප්‍රමාණයෙන් පර්චස් දහතුනයි දශම දෙකයි අට (අ. 0, රූ. 0, පර්. 13.28) ක් වේ.

2. කටුබැද්ද ගමෙහි පිහිටි මිහිරි පෙදෙස, වරිපනම් අංක 05 දරන ඒ හි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් ද ඇතුළත් ලේඩි කැතරින් ගෘෘප් යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙහි බලයලත් මානක ඩබ්ලිව්. ඒ. එන්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1999.06.16 දිනැති අංක 152 දරන පිඹුරෙහි ලොට් B ලෙස ලකුණු කර ඇති බෙද වෙන් කළ ඉඩම් කොටස වන අතර එකී ලොට් B ඉහත කී අංක 152 දරන පිඹුර ප්‍රකාරව උතුරට : ලොට් A වලින් ද, නැගෙනහිරට : සෝබන පෙදෙසේ වරිපනම් අංක 6 සහ 8 දරන පරිශ්‍රයන්ගෙන් ද, දකුණට : මිහිරි පෙදෙසේ වරිපනම් අංක 7 දරන පරිශ්‍රයෙන් ද සහ බටහිරට : මිහිරි පෙදෙසින් ද මායිම් වන අතර ප්‍රමාණයෙන් පර්චස් දහතුනයි දශම දෙකයි අට (අ. 0, රූ. 0, පර්. 13.28) ක් වේ.

ඉහත කී පිඹුරුඅංක 152හි දක්වා ඇති එකී ලොට් A සහ B පහත විස්තර කර ඇති ඉඩම්වල ඒකාබද්ධ කිරීමක් සහ නැවත මැනීමක උප බෙදුමක් වේ.

1. ඉහත කටුබැද්ද ගමෙහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් ද ඇතුළත් ලේඩි කැතරින් ගෘෘප් යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙහි බලයලත් මානක එල්. පී. එච්. ද සිල්වා විසින් සාදන ලද 1984.04.14 දිනැති අංක 1375 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස ලකුණු කර ඇති බෙදා වෙන් කළ ඉඩම් කොටස වන අතර එකී ලොට් 1 උතුරට : මිහිරි පෙදෙසේ වරිපනම් අංක 3 දරන පරිශ්‍රයෙන් ද, නැගෙනහිරට : සෝබන පෙදෙසේ වරිපනම් අංක 6 දරන පරිශ්‍රයෙන් ද, දකුණට : ලොට් 2න් ද සහ බටහිරට : මිහිරි පෙදෙසින් ද මායිම් වන අතර ප්‍රමාණයෙන් එකී අංක 1375 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විස්සයි දශම දෙකයි පහ (අ. 0, රූ. 0, පර්. 20.25) ක් වේ. මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 2549/202හි ලියාපදිංචි වී ඇත.

2. කටුබැද්ද ගමෙහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් ද ඇතුළත් ලේඩි කැතරින් ගෘෘප් යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙහි බලයලත් මානක එල්. පී. එච්. ද සිල්වා විසින් සාදන ලද 1984.04.14 දිනැති අංක 1375 දරන පිඹුරෙහි ලොට් 2 ලෙස ලකුණු කර ඇති බෙදා වෙන් කළ ඉඩම් කොටස වන අතර එකී ලොට් 2 උතුරට : ලොට් 1න් ද, නැගෙනහිරට : සෝබන පෙදෙසේ වරිපනම් අංක 8 දරන පරිශ්‍රයෙන් ද, දකුණට : ලොට් 3න් ද සහ බටහිරට : මිහිරි පෙදෙසින් ද මායිම් වන අතර ප්‍රමාණයෙන් එකී අංක 1375 දරන පිඹුර ප්‍රකාරව පර්චස් හයයි දශම තුනයි එක (අ. 0, රූ. 0, පර්. 6.31) ක් වේ. මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 2549/203හි ලියාපදිංචි වී ඇත.

පහත සඳහන් ඉඩම මතින් සහ ඒ හරහා මාර්ග අයිතිය ද ඇතුළුව :

ඉහත කී කටුබැද්ද සහ තෙලවල ගම්වල පිහිටි ලේඩි කැතරින් ගෘෘප් යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙහි බලයලත් මානක එච්. එම්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1966.02.28 දිනැති අංක 3374 දරන පිඹුරෙහි ලොට් 63 (අඩි 20ක් පළල පාරක් සඳහා වෙන් කර ඇති ඉඩම) ලෙස ලකුණු කර ඇති බෙදා වෙන් කළ ඉඩම් කොටස වන අතර එකී ලොට් 63 උතුරට : තෙලවල පාරෙන් ද, නැගෙනහිරට : ලොට්ස් 64 සහ 77න් ද, දකුණට : එම ඉඩමේම කොටසකින් ද සහ බටහිරට : ලොට් 51 සිට 62 සහ 44න් ද මායිම් වන අතර ඉහත කී පිඹුරුඅංක 3374 ප්‍රකාරව ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දාහතරයි දශම දෙක (අ. 0, රූ. 1, පර්. 14.2) ක් වේ. මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 2376/228හි ලියාපදිංචි වී ඇති අතර එය M 2376/245 වෙත ඉදිරියට ගෙන ගොස් ඇත.

ඉහත කී ඉඩම සහ/හෝ ගොඩනැගිලි වලට ස්ථිර ලෙසම සවිකර ඇති හෝ කලින් කළ සවි කරනු ලබන සෑම සහ සියළු නිශ්චල සවිකිරීම්, ඇමුණුම් සහ සේවාවන් ද සමග වන අතර විදුලිය සැපයීමේ පද්ධති සහ උපකරණ විදුලි සංදේශ උපකරණ, ජල පොම්ප, පයිප්ප සහ වෙනත් උපකරණ ඇතුළත් ජලය සැපයීමේ පද්ධති සහ වායුසමීකරණ පද්ධති/උපකරණ ද ඇතුළුව වේ.

අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිළධාරි,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

05 - 309

---

### ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන)පනතේ 04 වන වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුව විසින් සම්මත කරන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවේ අනුප්‍රාප්තික ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2016 පෙබරවාරි 24 දින දී ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවේ අනුප්‍රාප්තික ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුව නමට හොරණ ප්‍රසිද්ධ නොතාරිස් කේ.පී. කහවිදන විසින් ලියා සහතික කරන ලද අංක 1246 හා 2010 අගෝස්තු 13 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි සංස්ථා ගතකර ඇත්තා වූ ද ලියාපදිංචි කාර්යාලය හොරණ පිහිටා ඇත්තා වූ ද ලියාපදිංචි අංක 14344 දරන, මෙහි මින් ඉදිරියට "එකී සමාගම" යනුවෙන් සඳහන් කරන "නෝර්ටන් ටී ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවෙට්)ලිමිටඩ්" යන සමාගම විසින් පැහැර හැර ඇති හෙයින් ද;

2015 දෙසැම්බර් 31 දිනට එකී "නෝර්ටන් ටී ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්" සමාගමෙන් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුවට රුපියල් හැට ලක්ෂ අසූපන් දහස් තුන්සිය අසූදෙකකුත් ශත දෙළහක (රු.60,85,382/12) මුදලක් සහ 2016 ජනවාරි 01 දින පටන් විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හැට ලක්ෂයක් (රු.60,00,000.00) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන,

බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට පහක් (5.0%) ඉහළ අනුපාතිකයක් මත ගණනය කරනු ලබන අනුපාතිකය මත පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද;

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් හැටලක්ෂ අසූපන්දහස් තුන්සිය අසූදෙකකුත් ශත දොළහක් (රු.60,85,382.12) වූ මුදල සහ 2016 ජනවාරි 01 දින පටන් විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හැට ලක්ෂයක් (රු.60,00,000.00) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට පහක් (5.0%) ඉහළ අනුපාතිකයක් මත ගණනය කරනු ලබන අනුපාතිකය මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාර එකී අංක 1246 දරන උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සි බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තුද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1246 දරන උකස් බැඳුම්කරය මගින් සමාගමේ අධ්‍යක්ෂවරුන් වන නාගොඩගේ දෙන් අශෝක චන්දන නාගොඩ සහ පුලහින්ගේ අමලා චන්ද්‍රා කුමාරි යන අය විසින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

*අංක 1246 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කර තිබෙන දේපළ විස්තරය*

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, කුඹුකේපත්තුවේ, හොරණ නගරසභා සීමාව ඇතුළත පානදුර-රත්නපුර (A-8) මහා මාර්ගය දිගට සහ එම මහා මාර්ගයෙන් ඔබ්බෙහි පිහිටි මල්බද්දේ හේන, මඩවකගහවත්ත, හැඩවකගහහේන සහ මොල්පද්දකැලේ නමැති ඉඩම වන දැනට "ලෙස්ලි ලෑන්ඩ්" යනුවෙන් ප්‍රකට ඉඩමේ, බලයලත් මානක බී. ඒ. පී. ජයසූරිය විසින් මැන සකස් කළ අංක 3576 හා 2004.12.06 වැනි දින දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ බිම් කට්ටිය වූ වරිපනම් අංක 332/17, 332/18 දරන බිම් කට්ටියට මායිම්, උතුරට : ලොට් අංක 81 (අඩි 20ක් පළල පාර සඳහා වෙන් කළ බිම) ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් අංක 68 ද, දකුණට : ටී. පී. අංක 256430 දරන පිඹුරේ නිරූපිත "දික්හේන" නැමැති ඉඩම ද, බස්නාහිරට : ලොට් අංක 79 සහ 78 (අඩි 30ක් පළල පාර සඳහා වෙන් කළ බිම) ද යන මායිම් ඇතුළත එකී අංක 3576 දරන පිඹුර ප්‍රකාර රූඩ් එකක් (අ.0, රූ.1, ප. 00) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම.

ඉහතින් වූ උපලේඛනයේ සවිස්තරව විස්තර කර තිබෙන ඉඩම, මෙහි පහත සවිස්තරව විස්තර කර තිබෙන ලොට් අංක 66 සහ 67 ලකුණු කළ ඉඩම් ඒකාබද්ධ කිරීමෙන් සංයුක්ත වූ ඉඩම් වේ.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, කුඹුකේපත්තුවේ, හොරණ නගරසභා සීමාව ඇතුළත පානදුර-රත්නපුර (A-8) මහා මාර්ගය දිගට සහ එම මහා මාර්ගයෙන් ඔබ්බෙහි පිහිටි මල්බද්දේ හේන, මඩවකගහවත්ත, හැඩවකගහහේන සහ මොල්පද්දකැලේ නමැති ඉඩම වන දැනට "ලෙස්ලි ලෑන්ඩ්" යනුවෙන් ප්‍රකට ඉඩමේ, බලයලත් මානක කේ.එම්. සමරසිංහ විසින් මැන සකස් කළ අංක 960 හා 1962.01.22 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 66 ලකුණු කළ බෙද වෙන්කළ බිම් කට්ටියට මායිම්, උතුරට : ලොට් අංක 67 ද, නැගෙනහිරට : ලොට් අංක 68 ද, දකුණට : ටී.පී. අංක 256430 දරන ඉඩම ද, බස්නාහිරට : ලොට් අංක 79 සහ 78 (අඩි 30ක් පළල පාර සඳහා වෙන්කළ බිම) ද යන මායිම් ඇතුළත එකී අංක 960 දරන පිඹුර ප්‍රකාර පර්චස් විස්සක (අ.0, රූ.0, පර්. 20) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, කුඹුකේපත්තුවේ, හොරණ නගරසභා සීමාව ඇතුළත පානදුර - රත්නපුර (A-8) මහා මාර්ගය දිගට සහ එම මහා මාර්ගයෙන් ඔබ්බෙහි පිහිටි මල්බද්දේ හේන, මඩවකගහවත්ත, හැඩවකගහහේන සහ මොල්පද්දකැලේ නමැති ඉඩම වන දැනට "ලෙස්ලි ලෑන්ඩ්" යනුවෙන් ප්‍රකට ඉඩමේ, බලයලත් මානක කේ.එම්. සමරසිංහ විසින් මැන සකස් කළ අංක 960 හා 1962.01.22 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 66 ලකුණු කළ බෙද වෙන්කළ බිම් කට්ටියට මායිම්, උතුරට : ලොට් අංක 81 ද, නැගෙනහිර : ලොට් අංක 68 ද, දකුණට : ලොට් අංක 66 ද, බස්නාහිරට : ලොට් අංක 78 ද යන මායිම් ඇතුළත එකී අංක 960 දරන පිඹුර ප්‍රකාර පර්චස් විස්සක (අ. 0, රූ. 0, ප. 20) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම.

මෙයට මෙහි පහත විස්තර කරන (පාරක් සඳහා වෙන්කළ) ලොට් අංක 78 බිම් කට්ටිය මතින් මාර්ග අයිතියටද හිමි වේ.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, කුඹුකේපත්තුවේ, හොරණ නගරසභා සීමාව ඇතුළත පානදුර-රත්නපුර (A-8) මහා මාර්ගය දිගට සහ එම මහා මාර්ගයෙන් ඔබ්බෙහි පිහිටි මල්බද්දේ හේන, මඩවකගහවත්ත, හැඩවකගහහේන සහ මොල්පද්දකැලේ නමැති ඉඩම වන දැනට "ලෙස්ලි ලෑන්ඩ්" යනුවෙන් ප්‍රකට ඉඩමේ, බලයලත් මානක කේ.එම්. සමරසිංහ විසින් මැන සකස් කළ අංක 960 හා 1962.01.22 වැනි දින දරන පිඹුරේ නිරූපිත (පාරක් සඳහා වෙන්කළ) ලොට් අංක 78 ලකුණු කළ බෙද වෙන්කළ බිම් කට්ටියට මායිම්, උතුරට : රත්නපුරට යන මහා මාර්ගය ද, නැගෙනහිරට : ලොට් අංක 23,24,44,81,67 සහ 66 ශ්‍රීපාලියට අයිති ඉඩම ද, දකුණට : ලොට් අංක 79 ද, බස්නාහිරට : ලොට් අංක 65,64,46,45,22,08 සහ 07 ද යන මායිම් ඇතුළත එකී අංක 960 දරන පිඹුර ප්‍රකාර පර්චස් විසිඑකයි දශම හතක (අ. 0, රූ. 0, ප. 21.7) බිම් ප්‍රමාණයෙන් යුතු බිම් කට්ටිය. (මෙය හොරණ ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.)

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, කුඹුකේපත්තුවේ, හොරණ නගරසභා සීමාව ඇතුළත පානදුර-රත්නපුර (A-8) මහා මාර්ගය දිගට සහ එම මහා මාර්ගයෙන් ඔබ්බෙහි පිහිටි මල්බද්දේ හේන, මඩවකගහවත්ත, හැඩවකගහහේන සහ මොල්පද්දකැලේ නමැති ඉඩම වන දැනට "ලෙස්ලි ලෑන්ඩ්" යනුවෙන් ප්‍රකට ඉඩමේ, බලයලත් මානක කේ. එම්. සමරසිංහ විසින් මැන සකස් කළ අංක 960 හා 1962.01.22 වැනි දින දරන පිඹුරේ නිරූපිත (පාරක් සඳහා වෙන්කළ) ලොට් අංක 81 ලකුණු කළ බෙද වෙන්කළ බිම් කට්ටියට මායිම්, උතුරට : ලොට් අංක 44,43,42,41 සහ 40 ද, නැගෙනහිරට : ලොට් අංක 39 ද, දකුණට : ලොට් අංක 71,70,69,68 සහ 67 ද, බස්නාහිරට : ලොට් අංක 78 ද යන මායිම් ඇතුළත එකී අංක 960 දරන පිඹුර ප්‍රකාර පර්චස් විසිහතරක (අ. 0, රූ, 0, ප. 24) බිම් ප්‍රමාණයෙන් යුත් බිම් කට්ටිය. (මෙය හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.)

ඒ.ආර් ප්‍රනාන්දු,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී,
අංක. 73/5, ගාලු පාර,
කොළඹ 03.

05 - 378

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

ආර්. පී. එස්. ප්‍රියන්ත සහ ආර්. පී. එන්. ප්‍රේමකුමාර.
ගිණුම් අංක : 0197 5000 0021.

සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015 ක් වූ සැප්තැම්බර් මස 30 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ජේ. බණ්ඩාර යන අය විසින් ලියා සහතික කරන ලද 2012 සැප්තැම්බර් මස 12 දාතම හා අංක 3611 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි පළමු උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළවල බදුකර අයිතීන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රත්තිරත් ජේදිගේ සුදත් ප්‍රියන්ත සහ රත්තිරන් ජේදිගේ නිලන්ත ප්‍රේමකුමාර යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 3611 දරන බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුලු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් තිස් පන් ලක්ෂ අනූ හතර දහස් පන්සිය හැට හතයි ශත හතළිස් අටක (රු. 35,94,567.48) මුදලක් 2015 අගෝස්තු මස 11 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් තිස් පන් ලක්ෂ අනූ හතර දහස් පන්සිය හැට හතයි ශත හතළිස් අටක (රු. 35,94,567.48) මුදල ද, 2015 අගෝස්තු මස 12 වැනි දින සිට අංක 3611 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දහ හතර ලක්ෂ හතළිස් පන් දහස් හත්සිය පනස් හතයි ශත විසි තුනක (රු. 14,45,757.23) මුදලක් සඳහා පස් වාර්ෂික භාණ්ඩාගාර බැඳුම්කර + වාර්ෂිකව සියයට දෙකක් (2%) (7.5%ක අවමය) බැගින් හා තවත් රුපියල් පන් ලක්ෂ හතළිස් නම දහස් එකසියයක (රු. 5,49,100) පස් වාර්ෂික භාණ්ඩාගාර බැඳුම්කර + වාර්ෂිකව සියයට දෙකක් (2%) (7.5%ක අවමය) බැගින් හා තවත් රුපියල් පහළොස් ලක්ෂයක (රු. 15,00,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ නමයක් (19%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 3611 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, තිස්සව කෝරළේ, දේවමැදි හත්පත්තුවේ, පඬුවස්නුවර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ ඇල්ලේගෙදර ග්‍රාමයේ පිහිටි "බෝගහමුලවත්ත, කෝන්ගහමුලහේන, පරගහවත්ත සහ පේරගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. ඩබ්ලිව්. නන්දසේන යන අය විසින් සාදන ලද 2000 ජූනි මස 11 දාතම හා අංක 602 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 02 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම පිඹුරේ ලොට් 03 සහ ලෙනිෆා උම්මා, ඒ. එන්. අනුදීන් සහ එස්. කේ. ටී. එම්. කුමාරිහාමි යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම්, නැගෙනහිරට : පුටරින් වත්ත (පොල්වත්ත), දකුණට : බණ්ඩාරකොස්වත්ත වැව සහ බස්නාහිරට : මෙම පිඹුරේ ලොට් 01 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර තුනයි රූඩ් එකයි පර්චස් දහ හතයි දශම හයක් (අ. 3, රූ. 01, පර්. 17.6) හෝ හෙක්ටයාර 1.3596ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 602 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව D 1177/239 යටතේ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

දිගේ සහ ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය :

එකී ඇල්ලේගෙදර ග්‍රාමයේ පිහිටි "බෝගහමුලවත්ත, කෝන්ගහමුලහේන, පරගහවත්ත සහ පේරගහවත්ත" යයි කියනු ලබන අංක 602 දරන එකී පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 03 (මාර්ග වෙන්කිරීම්) වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : නූර් මොහොමඩ් යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ පාර, නැගෙනහිරට : මෙම පිඹුරේ ලොට් 02, දකුණට : මෙම පිඹුරේ ලොට් 02 සහ බස්නාහිරට : මෙම පිඹුරේ ලොට් 01 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දෙකයි දශම බිංදුවයි හතරක් (අ. 0, රූ. 0 පර්. 2.04) හෝ හෙක්ටයාර 0.0062ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 602 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව D 1437/60 යටතේ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

05 - 394

---

## යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ යූනියන් බැන්ක් ඔෆ් කළම්බු පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමයි

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය දරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව යූනියන් බැන්ක් ඔෆ් කළම්බු පීඑල්සී (මෙහි මින් මතු "යූනියන් බැංකුව" වශයෙන් හඳුන්වනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2016 මාර්තු මස 31 වැනි දින පවත්වන ලද රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මොරටුව, එගොඩ උයන, නදී මාවතේ, අංක 15 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන ප්‍රේමචන්ද්‍ර ටුවරිස්ට් හොටෙල් ආයතනයේ (අංක W/H 2005 යටතේ 2010.01.05 වැනි දින බස්නාහිර පළාතේ

ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කරන ලද,) හවුල්කරුවන් වන, මොරටුව, කටුකුරුන්ද, එගොඩ උයන, අංක 4, "සසික" නිවසේ පදිංචි මුතුතන්ත්‍රිගේ සෝමසිරි ප්‍රේමචන්ද්‍ර (ජා. හැ. අ. 523660187V) සහ මොරටුව, කටුකුරුන්ද, එගොඩ උයන, ජයන්ති මාවතේ, අංක 33 දරන ස්ථානයේ පදිංචි, මුතුතන්ත්‍රිගේ සචින්ත මදුරංග ප්‍රේමචන්ද්‍ර (ජා. හැ. අ. 893262911V) යන අය (මෙහි මින්මතු "බන්ධනදායීන් " වශයෙන් හඳුන්වනු ලබන) විසින් රුපියල් අනූ එක්ලක්ෂයක (රු. 91,00,000.00) වාර ණයක් ඇතුළුව කලින් කලට බැංකු ණය පහසුකම් ලබාගෙන ඇති බැවින් ද, ඒ අනුව, ඉහත කී වාර ණය පහසුකම නිසා යුනියන් බැංකුව වෙත අයවිය යුතු රුපියල් අනූ එක්ලක්ෂයක (රු. 91,00,000.00) මුදල සහ ඒ මත පොළිය ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් ඉහත කී බන්ධනදායී විසින් රුපියල් එක් කෝටි විසිපන් ලක්ෂයක (රු. 1,25,00,000.00) මුදලක් සඳහා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. සී. පීරිස් විසින් සහතික කරන ලද අංක 116 සහ 2013.05.27 වැනි දින දරන මුලික උකස් බැඳුම්කරය ලියා අත්සන් කොට තබා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද, ඉහත කී වාර ණය පහසුකම නිසා 2016.01.31 වැනි දිනට මුළු හිඟ මුදල වන රුපියල් අසූහත්ලක්ෂ අසූ අටදහස් හයසිය හැත්තෑදෙකකුත් ශත හැත්තෑහතරක (රු. 87,88,672.74) මුදල සහ ඒ මත 2016.02.01 වැනි දින සිට එකී දේපළ විකිණීමේ දිනය තෙක් පොළිය ද, එකී බන්ධනදායීන්ගෙන් යුනියන් බැංකුව වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති බැවින් ද,

ඉහත කී ණය ශේෂය එකී බන්ධනදායින් විසින් ගෙවා පියවා දැමීම පැහැර හැරීම සිදුකර ඇති බවට යුනියන් බැංකුව විසින් සෑහීමකට පත්වීමෙන් පසුව, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව යුනියන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලය ප්‍රකාරව ක්‍රියා කරමින්, ඉහත සඳහන් වාර ණය පහසුකම මත 2016.01.31 වැනි දිනට මුළු හිඟ මුදල වන රුපියල් අසූහත්ලක්ෂ අසූ අටදහස් හයසිය හැත්තෑදෙකකුත් ශත හැත්තෑහතරක (රු. 87,88,672.74) මුදල සහ ඒ මත 2016.02.01 වැනි දින සිට පොළිය ද, තව ද ඉහත කී අංක 116 සහ 2013.05.27 වැනි දින දරන උකස් බැඳුම්කරය සහ 1990 අංක 04 දරන එකී පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාරව යුනියන් බැංකුව වෙත අයකර ගැනීමට හිමිකම් ඇති වෙනත් සියලුම මුදල් ප්‍රමාණයන් ද අයකර ගැනීම සඳහා ඉහත කී අංක 116 සහ 2013.05.27 වැනි දින දරන උකස් බැඳුම්කරයේ බලය ප්‍රකාරව සහ ඊට යටත්ව බැංකුව වෙත උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ ඉහත කී 1990 අංක 04 දරන පනත ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට බලයලත් වෙන්දේසිකරුවන් වන ත්‍රිවංක ඇන්ඩ් සේනානායක වෙත බලය පැවරීමට 1990 අංක 4 දරන එකී පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ , පල්ලේ පත්තුවේ, මොරටුව මහ නගර සභා සීමාව තුළ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 555ඒ දරන දකුණු කටුකුරුන්ද ග්‍රාම නිලධාරි වසමේ, එගොඩ උයනේ පිහිටි නදී මාවතේ, වරිපනම් අංක 15 දරන මාදන්ගහවත්ත සහ පයරුගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. අයි. පෙරේරා විසින් මැන සාදන ලද අංක 2171 සහ 1997 පෙබරවාරි මස 25 වැනි දින දරන මානක පිඹුර ප්‍රකාර බෙදා වෙන්කළ බිම් කොටසට මායිම්, උතුරට : ඩබ්ලිව්. සුනිල් ප්‍රේමරත්න යන අය විසින් හිමිකම් කියන පරිශ්‍රය සහ අඩි 3ක් පළල පාර ද, නැගෙනහිරට : පානදුර ගඟ සහ නදී මාවතේ වරිපනම් අංක 17 දරන පරිශ්‍රය ද, දකුණට : නදී මාවතේ වරිපනම් අංක 1 1/2 සහ 17 සහ නදී මාවත ද, බස්නාහිරට : කේ. තිඩෙමැක්ස් පීරිස් සහ කේ. එස්. නිශාන්ත පීරිස් ලින්ටන් පෙරේරා යන අය විසින් හිමිකම් කියන පරිශ්‍රය සහ අඩි 5ක් පළල අඩි පාර සහ අඩි 8ක් පළල අඩි පාර ද, යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 2171 දරන පිඹුර අනුව රූඩ් දෙකකුත් පර්චස් එකයි දශම පහයි බිංදුවක් (අ. 0, රු. 2, පර්. 1.50) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේ ද සමග ය. මෙම දේපළ එම් 2330/69 දරන වෙළුමේ/පත්‍රිරුවේ යථා පරිදි ලියාපදිංචි කරන ලදුව, පසුව ලියාපදිංචිය දෙල්කඳ-නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 3284/55ට සහ ඩී 104/59ට ගෙන යන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

එස්. ඩී. එන්. එස්. කන්නන්ගර,
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

05 - 414

---

### පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - කොල්ලුපිටිය ශාඛාව

1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගනුදෙනුකරුගේ නම : "ජෙනරල් ඉන්ජිනියර්ස් ඇන්ඩ් සප්ලයර්ස් කම්පැනි" යන නාමය, විලාසය සහ ව්‍යාපාර නාමය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයක් ලෙස ව්‍යාපාර ගෙන යනු ලබන ඩොමිනික් සේවියෝ ඇන්තනී රොෂාන් මෝතා.

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2016.03.30 වැනි දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී :

එනම්, "ජෙනරල් ඉන්ජිනියර්ස් ඇන්ඩ් සප්ලයර්ස් කම්පැනි" යන නාමය, විලාසය සහ ව්‍යාපාර නාමය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයක් ලෙස ව්‍යාපාර ගෙන යනු ලබන ඩොමිනික් සේවියෝ ඇන්තනී රොෂාන් මෝතා විසින් කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී.කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ආර්. එල්. සී. රණසිංහ විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2013.10.11 දිනැති අංක 423 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය සහ වර්ෂ 2014.05.23 දිනැති අංක 536 දරන උකස් බැඳුම්කරය සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. මධුමාලි අල්විස් විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2014.07.14 දිනැති අංක 299 දරන උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී අංක 423, 536 සහ 299 දරන උකස් බැඳුම්කරයන් මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් 2015.11.26 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය ද, වශයෙන් රුපියල් නව මිලියන හාර ලක්ෂ පනස් හතර දහස් පන්සිය විසි එකයි ශත තිස් පහ (රු. 94,54,521.35) ක මුදල සහ 2015.11.27 වැනි දින සිට රුපියල් අට මිලියන හය ලක්ෂ අනූ තුන් දහස් හත්සිය අසූ හයයි ශත අසූ හය (රු. 86,93,786.86)ක මුදල මත වාර්ෂිකව 17% බැගින් පොළිය ද,

තවද, වර්ෂ 2015.11.26 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය ද, වශයෙන් රුපියල් දහ අට මිලියන හත් ලක්ෂ දෙදහස් හාරසිය පනස් දෙකයි ශත එකොළහයි (රු. 1,87,02,452.11) ක මුදල සහ 2015.11.27 වැනි දින සිට රුපියල් දාහත් මිලියන තුන් ලක්ෂ දෙදහස් අසූ අටයි ශත විසිපහ (රු. 1,73,02,088.25)ක මුදලමත වාර්ෂිකව 17% බැගින් පොළිය ද, සහ

වර්ෂ 2015.10.30 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය ද, වශයෙන් රුපියල් විසි පන් මිලියන එක් ලක්ෂ අනූ හතර දහස් අනූ තුනයි ශත අසූ හය (රු. 25,206,093.86)ක මුදල සහ 2015.11.01 වැනි දින සිට 2015.11.11 වැනි දින දක්වා රුපියල් විසි පන් මිලියන දෙලක්ෂ හය දහස් අනූ තුනයි ශත අසූ හය (රු. 25,206,093.86) ක මුදල මත වාර්ෂිකව 24% බැගින් පොළිය ද, ඉන්අනතුරුව වර්ෂ 2015.11.12 වැනි දින සිට මුළු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තෙක් රුපියල් විසි පන් මිලියන එක් ලක්ෂ අනූ හතර දහස් අනූ තුනයි ශත අසූ හය (රු. 2,51,94,093.86) ක මුදල මත 24% බැගින් පොළිය ද, පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

එකී අංක 423, 536 සහ 299 දරන උකස් බැඳුම්කරයන් යටතේ අයවිය යුතු එකී පනස් තුන් මිලියන තුන් ලක්ෂ පනස් එක් දහස් හැට හතයි ශත තිස් දෙක (රු. 5,33,51,067.32) ක මුදල ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද, ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල්ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ බැංකුව වෙත උකස්කර ඇති දේපළ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 180/3 (50/3) දරන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකාර තුසිත් කරුණාරත්න වෙත එකී 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙස ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ (හෝමාගම ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුළත) හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහනගර සභා සීමාව ඇතුළත කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත, සුහුතිපුර ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක 492 ඇතුළත, මිනිවන්විල බත්තරමුල්ල, තලංගම, 2 වන පටුමග, සුහුතිපුර, දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක ජේ. ඒ. ඩබ්. කාර්වල්හෝ විසින් සකසන ලද අංක 43/2012 දරන 2012 අප්‍රේල් මස 17 දිනැති පිඹුරෙහි බෙදා වෙන් කරන ලද ලොට් 1ඒ වශයෙන් ලකුණු කළ බිම් කොටස වූ (බලයලත් මානක සී. ඊ. එන්. ජයවර්ධන විසින් සකසන ලද අංක 722 සහ 1995 ඔක්තෝබර් මස 09 දිනැති පිඹුරෙහි ලොට් අංක 1, 2, 3 සහ 4 හා බලයලත් මානක, එස්. ඩී. ලියනසූරිය විසින් සකසන ලද අංක 6903 දරන 1998 ජූනි මස 06 දිනැති පිඹුරෙහි ලොට් 4බී සහ 3 බී හි නැවත මැනීමක් සහ ඒකාබද්ධ කිරීමක් වන) දැනට වරිපනම් අංක 36/6, 36/7 සහ 36/8 දරන ඉඩමට මායිම්, උතුරට : සුරබියෙල් සහ අනෙකුත් අයගේ උරුමකරුවන්ගේ කුඹුරු සහ සෝමපාල පෙරේරා සහ අනෙකුත් අයගේ ඉඩම් ද, නැගෙනහිරට : පාර ද, දකුණට : බලයලත් මානක සී. ඩී. එස්. ගුණතිලක විසින් සකසන ලද අංක 691 දරන පිඹුරෙහි ලොට් 2 සහ බලයලත් මානක සී. ඊ. එන්. ජයවර්ධන විසින් සකසන ලද අංක 722 පිඹුරෙහි ලොට් 5 ද සහ බස්නාහිරට : බලයලත් මානක, එස්. ඩී. ලියනසූරිය විසින් සකසන ලද අංක 6903 දරන පිඹුරෙහි ලොට් 3ඒ සහ 4ඒ ද වන ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් පහළොවයි දශම හතරයි බින්දුව (අ. 0, රූ. 1, පර්. 15.40) ක් වූ ඉඩම සමග ඒ මතවූ ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියල්ලද සමග වේ. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරු බී 627/92 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉරාන්ත් රොද්‍රිගු,
කළමනාකරු - ණය අයකරවා ගැනීම්.

05 - 426

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කැලණිය ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

විරාජ් පද්ම විභූෂණ සේනානායක.

2016 මාර්තු මස 30 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දා වූ ද 2013 ජූනි මස 18 වැනි දින සහතික කළ අංක 4722 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම විරාජ් පද්මවිභූෂණ සේනානායක යන අය ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හැටලක්ෂ පනස්තුන් දහස නමසිය හැත්තෑ එකයි ශත හතළිස් හතර (රු.60,53,971.44) ක මුදලක් 2016 පෙබරවාරි 15 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රුපියල් හැටලක්ෂ පනස්තුන් දහස නමසිය හැත්තෑ එකයි ශත හතළිස් හතර (රු.60,53,971.44) ක මුදල අයකර ගැනීම සඳාහ 2016 පෙබරවාරි මස 16 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 4722 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරී පත්තුවේ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 277ඒ, බටහිර ගෝනවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බියගම ප්‍රාදේශීය සභා සීමාව තුළ මාකොළ උප කාර්යාලයේ, ගෝනවල පාරේහි පිහිටි මිල්ලගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. එම්. වීරකෝන් බණ්ඩා විසින් 1995 ජූලි මස 06 වැනි දින පිළියෙළ කරන ලද අංක 298ඒ දරන පිඹුරේ ලොට් 3ඒ වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : එමලින් වීරකෝන් සහ තවත් දෙදෙනෙකුගේ ඉඩමෙන් ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු බී. පී. ගංගොඩවිල විසින් 1979 දෙසැම්බර් මස 26 වැනි දින පිළියෙළ කරන ලද අංක 4146 දරන පිඹුරේ ලොට් 4න් ද, දකුණට : පාර (බලයලත් මිනින්දෝරු බී. පී. ගංගොඩවිල විසින් පිළියෙල කරන ලද අංක 4146 දරන පිඹුරේ ලෝට් 5) ද සහ බස්නාහිරට : බලයලත් මිනින්දෝරු ඩබ්. එම්. වීරකෝන් බණ්ඩා විසින් 1995 ජූලි මස 06 වැනි දින මැන පිළියෙළ කරන ලද අංක 298 දරන පිඹුරේ ලොට් 2ඒ වලින් ද මායිම් වූ එකී අංක 298ඒ දරන පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් එකයි දශම දෙකයි බිංදුව (අ. 0, රූ. 1, පර්. 1.20)ක විශාලත්වයෙන් යුක්ත වේ.

ඉහත සඳහන් ඉඩම මෑතකදී කළ මැනීමකින් පසු මෙසේ විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරී පත්තුවේ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 277ඒ, බටහිර ගෝනවල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, බියගම ප්‍රාදේශීය සභා සීමාව තුළ මාකොළ උප කාර්යාලයේ, ගෝනවල හි පිහිටි ගෝනවල පාරේ වරිපනම් අංක 388/69 දරන මිල්ලගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. සී. ඇපාසිංහ විසින් 2012 නොවැම්බර් මස 28 වැනි දින මැන පිළියෙළ කරන ලද අංක 1512 දරන පිඹුරේ ලොට් 3ඒ1 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : පාර (ගෝනවල මාර්ගයේ සිට නිවාස දක්වා) ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු බී. පී. ගංගොඩවිල විසින් 1979 දෙසැම්බර් මස 26 වැනි දින මැන පිළියෙළ කරන ලද අංක 4146 දරන පිඹුරේ ලොට් 4න් ද, දකුණට : බලයලත් මිනින්දෝරු බී. පී. ගංගොඩවිල විසින් 1979 දෙසැම්බර් මස 26 වැනි දින මැන පිළියෙළ කරන ලද අංක 4146 දරන පිඹුරේ ලොට් 5 (පාරක් සඳහා වෙන්කරන ලද) සහ බලයලත් මිනින්දෝරු ඩබ්. එම්. වීරකෝන් බණ්ඩා විසින් 1995 ජූලි මස 06 වැනි දින පිළියෙළ කරන ලද අංක 298 දරන පිඹුරේ ලොට් 2ඒ ද සහ බස්නාහිරට : බලයලත් මිනින්දෝරු ඩබ්. එම්. වීරකෝන් බණ්ඩා විසින් 1995 ජූලි මස 06 වැනි දින මැන පිළියෙළ කරන ලද අංක 298 දරන පිඹුරේ ලොට් 2ඒ වලින් ද මායිම් වූ එකී අංක 1512 දරන පිඹුර ප්‍රකාරව පර්චස් තිස්පහයි දශම බිංදුවයි පහ (අ. 0, රූ. 0, පර්. 35.05) ක විශාලත්වයෙන් යුක්ත වේ.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණි (නීති),
මාණ්ඩලික ලේකම්.

05 - 440/1

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කැළණිය ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

රූපසිංහ ආරච්චිගේ මේනක සුරංග ගුණතිලක.

2016 මාර්තු මස 30 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දා වූ ද 2013 සැප්තැම්බර් මස 11 වැනි දින සහතික කළ අංක 9918 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම රූපසිංහ ආරච්චිගේ මේනක සුරංග ගුණතිලක යන අය ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් අසූ තුන් ලක්ෂ හැත්තෑපන් දහස් අටසිය පනස්හයයි හත විසි පහ (රු. 83,75,85625) ක මුදලක් 2016 පෙබරවාරි 09 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රුපියල් අසූ තුන් ලක්ෂ හැත්තෑපන් දහස් අටසිය පනස්හයයි හත විසි පහ (රු. 83,75,856.25) ක මුදල අයකර ගැනීම සඳහා 2016 පෙබරවාරි මස 10 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිපුර පොළිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 9918 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරී පත්තුවේ, කැළණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කැළණිය ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක 264 දරන කැළණිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ වසම් අංක 8 කැළණිය හි පිහිටි බියගම පාරේ වරිපනම් අංක 1328, 1328/1, 1328 1/1, 1328බී සහ 1328සී දරන රයන්දවත්ත හෙවත් රේන්දවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩබ්. ඩී. එස්. ද සිල්වා විසින් 1997 ජූනි මස 06 වැනි දින පිළියෙල කරන ලද අංක 3727 දරන පිඹුරේ ලොට් 1ඒ දරන ඉඩම් කොටසට මායිම් උතුරට : බියගම පාරෙන් ද, නැගෙනහිරට : අඩි 15ක් පළල පාරෙන් ද, දකුණට : සී රාජපක්ෂ ගේ ඉඩමෙන් ද සහ බස්නාහිරට : ලොට් 1බී වලින් ද මායිම් වූ එකී අංක 3727 දරන පිඹුර ප්‍රකාරව පර්චස් නමයයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 9.5)ක විශාලත්වයෙන් යුක්ත වන මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ පත්ඉරු සී 744/220 යටතේ ලියාපදිංචි කර ඇත.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණි (නීති),
මාණ්ඩලික ලේකම්.

05 - 440/2

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - දෙල්ගොඩ ශාඛාව
## (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

වර්ෂ 2016ක් වූ මාර්තු මස 04 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව සම්මත කරන ලදී.

විතානගේ චම්පික ලක්මාලි පෙරේරා සහ මැද්දේගේ ප්‍රදීප් සුසන්ත, අංක 54, නාරංවල, ගම්පහ

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. ඒ. එන්. ඩබ්. රාජකරුණා විසින් 2007.03.01 වැනි දින ලියා සහතික කරන ලද අංක 24756 දරන බැඳුම්කරයේ සඳහන් නිශ්චල දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.07.29 වැනි දින ඇති කරගත් යෝජනා සම්මුතිය ප්‍රකාර බලයලත් වෙන්දේසිකරු එස්. මනම්පේරි වෙත පවරනු ලැබූ බලය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමට ද, එකී 2007.03.01 වැනි දින දරන අංක 24756 දරන බැඳුම්කරය යටතේ දේපළ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය ලවා වෙන්දේසියේ විකිණීමට බලය පැවරීමට ද,

එකී 2010.07.29 වැනි දින දරන සම්මුතිය මෙම නව යෝජනා සම්මුතියේ සඳහන් වන තාක් දුරට සංශෝධනය කිරීමටත් ය.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

05 - 440/3

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - කොල්ලුපිටිය ශාඛාව (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

වර්ෂ 2016 ක් වූ මාර්තු මස 04 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව සම්මත කර ගන්නා ලදී.

දොන් බුද්ධික දිනේෂ් ගුණසේකර, අංක.17, විහාරවත්ත පාර, පතිරගොඩ, මහරගම.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී එන්. බී. පෙරේරා විසින් 2007.03.23 වැනි දින ලියා සහතික කරන ලද අංක. 2988 දරන බැඳුම්කරයේ සඳහන් නිශ්චල දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.01.07 වැනි දිනට යෝජනා සම්මුතිය ප්‍රකාර බලයලත් වෙන්දේසිකරු එස්. මනම්පේරි වෙත පවරනු ලැබූ බලය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමට ද, එකී 2007.03.23 දින ලියා සහතික කරන ලද අංක. 2988 දරන බැඳුම්කරය යටතේ දේපල ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩලස් කේලාර්ඩ් යන අය ලවා වෙන්දේසියේ විකිණීමට බලය පැවරීමට ද,

එකී 2010.01.07 වැනි දින දරන සම්මුතිය මෙම නව යෝජනා සම්මුතියේ සඳහන් වන තාක් දුරට සංශෝධනය කිරීමටත්ය.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

05 - 440/4

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - බොරලැස්ගමුව ශාඛාව (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

වර්ෂ 2016 ක් වූ මාර්තු මස 04 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව සම්මත කර ගන්නා ලදී.

ළමාකොටනගේ අරුණ කුමුදු සියඹලාගොඩ,
අංක.108/9 ඒ, එගොඩවත්ත පාර, බොරලැස්ගමුව.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හල්ලොලුව විසින් 2003.03.11 වැනි දින ලියා සහතික කරන ලද අංක.394 සහ 2003.08.05 දින ලියා සහතික කරන ලද අංක 534 දරන බැඳුම්කරවල සඳහන් නිශ්චල දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.07.29 වැනි දිනට යෝජනා සම්මුතිය ප්‍රකාර බලයලත් වෙන්දේසිකරු ආර්. එස්. මහානාම වෙත පවරනු ලැබූ බලය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමට ද, එකී 2003.03.11 දින ලියා සහතික කරන ලද අංක.394 සහ 2003.08.05 වැනි දින ලියා සහතික කරන ලද අංක 534 දරන බැඳුම්කරයන් හි සඳහන් දේපල ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට බලය පැවරීමට ද,

එකී 2008.07.29 වැනි දින දරන සම්මුතිය මෙම නව යෝජනා සම්මුතියේ සඳහන් වන තාක් දුරට සංශෝධනය කිරීමටත්ය.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

05 - 440/5

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.